අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය
அத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்
OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES

**2025-දෙසැම්බර්-01 : 10.30PM**
**File Number : 2025/03**

# මාධ්‍ය නිවේදනය

## ආපදා තත්ත්වය නිසා පීඩාවට පත්වූවන් සඳහා වූ ආපදා සහන සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග

රටට බලපෑ ස්වභාවික ආපදා තත්ත්වය හේතුවෙන්, අතුරුදහන් වූවන්ගේ මරණ ලියාපදිංචිය සඳහා, 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ II වන කොටසේ 9 වන වගන්තියට අනුව, ගැසට් නිවේදනයක් මඟින් බලපෑමට ලක් වූ ප්‍රදේශ "ජාතික ව්‍යවසනාප්‍රාප්ත ප්‍රදේශ" ලෙස ප්‍රකාශයට පත්කිරීමට, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පියවර ගනු ඇත.

මෙමගින්, ආපදාව අතරතුර මියගිය පුද්ගලයන් සඳහා මරණ සහතික නිකුත් කිරීමට සහ අතුරුදන් වූ බවට වාර්තා වූවන්ගේ මරණ ලියාපදිංචි කිරීමට හැකි වේ. ඒ අනුව, විධිමත් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය වහාම ආරම්භ කිරීමට හැකි වන පරිදි, අදාළ බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත, අතුරුදන් වූ පුද්ගලයන්ගේ මරණ ලියාපදිංචි කිරීමේ බලය පැවරෙනු ඇත.

අද උදෑසන වන විට හඳුනාගෙන ඇති පරිදි, රට පුරා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග 108ක් ප්‍රතිසංස්කරණය කළ යුතු බව වාර්තා වී ඇත. මේ හේතුවෙන් , LP ගෑස් නිසි පරිදි බෙදා හැරීමේදී ඇති විය හැකි ගැටළු හඳුනාගැනීමට සහ කඩිනම් විසඳුම් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා ලිට්‍රෝ ගෑස් (Litro Gas) සමාගම සමඟ සාකච්ඡා පැවැත්වීමට කටයුතු කෙරේ. තවද, මෙම ආපදා තත්ත්වය තුළ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමේදී මහජනතාව මුහුණ දෙන දුෂ්කරතා හඳුනා ගැනීම සහ අදාළ සැපයුම්කරුවන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ භාණ්ඩ ලැයිස්තු මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගනු ඇත. මෙමගින් සැපයුම්කරුවන්ට අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන් සම්බන්ධ කර ගනිමින්, හඳුනාගත් ද්‍රව්‍ය සැපයීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට හැකිවේ.

ඊට අමතරව, ආපදාවෙන් පීඩාවට පත් වූ ජනතාවට මධ්‍ය කාලීන සහන සැලසීම සඳහා, ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබුණු තොරතුරු මෙන්ම අනෙකුත් රජයේ ආයතනවලින් ලබාගත් තොරතුරු ද අග්‍රාමාත්‍ය කාර්යාලයට ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන්ට උපදෙස් දී ඇත. මෙම අවශ්‍යතා, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය විසින් සකස් කරන ලද පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකෘතියකින් ප්‍රදර්ශනය කරනු ඇත. එමගින් ආධාර ලබාදීමට කැමති දේශීය හා ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන්ට ඔවුන්ට සැපයිය හැකි භාණ්ඩ මොනවාදැයි පැහැදිලිව හඳුනා ගැනීමට හැකි වේ. මෙම යාන්ත්‍රණය මඟින් අනවශ්‍ය භාණ්ඩ ලැබීම වැළැක්වීමට, අත්‍යවශ්‍ය අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඇති බව සහතික කිරීමට සහ අදාළ ස්ථාන වෙත ආධාර නිසි පරිදි බෙදා හැරීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. තවද, විදේශයන්ගෙන් ලැබෙන භාණ්ඩ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නාමය යටතේ භාරගනු ලබන අතර, එම සැපයුම් සඳහා අවශ්‍ය රේගු බදු සහන ලබා දීමට එයින් හැකි වේ.

ඊට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමිතීන්ට අනුකූල ශීතකළ එළවළු ආනයනය කිරීමට රජය තීරණය කර ඇත.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්

**Email Address:** cg@esgovsl.com ; cg@ocges.gov.lk
අංක 150, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
எண். 150, ஆர்.ஏ. டி மல் மாவத்தை, கொழும்பு 03, இலங்கை
No. 150, R.A. De Mal Mawatha, Colombo 03, Sri Lanka